# අනුරාධපුර යුගයේ අත්තාණි කණුවල දක්වෙන පුරාතන ලංකාවේ වෘක්ෂ ආරක්ෂණය.

පී. තරිඳු මධුශාන් පීරිස්, යෂන්ත රුවන් කුලතුංග, ක. ක. ග. රන්දුල*

---

පරිසර ආරක්ෂණය පිළිබඳ සාකච්ඡාව පරිසර විනාශයකදී පමණක් සාකච්ඡා කරන ලද විෂයයක් ලෙස හඳුනාගෙන තිබේ. පාරිසරික ආරක්ෂණයේ දී වෘක්ෂ ආරක්ෂණය සියළු හරිත ප්‍රතිපත්තීන් අතරින් වඩාත්ම වැදගත් ක්‍රමවේදයයි. මෙම පර්යේෂණයෙහි අරමුණ අනුරාධපුර යුගයේ වෘක්ෂ ආරක්ෂණය සඳහා රාජකීය / රජයේ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් විමර්ශනයට ලක්කිරීම යි. මෙහි ප්‍රධාන අරමුණ වශයෙන් පරීක්ෂාවට ලක්කොට ඇත්තේ, නවවන සහ දහවන සියවස් වලදී රාජ සභාව (එක්තැන් සමිය) විසින් පනවන ලද නීති, මුක්ති දීමනා ආඥාවන් සටහන් කරන ලද කණු වශයෙන් සැලකෙන අත්තාණි පරිහාර ලේඛණයන්හි දක්වෙන වෘක්ෂ ආරක්ෂණය පිළිබඳව ය. රණාව, පුලියන්කුලම, ඇතාකන්ද ආදි ලිපි කිහිපයකින් ම දක්වා ඇත්තේ කැපීම තහනම් කරන ලද ශාක විශේෂ කිහිපයක් සම්බන්ධව යි. එසේ නොකැපිය යුතු වෘක්ෂ අතර, පොල් ගස් (*පුළුපන්* / *Cocos nucifera*), මී ගස් (*මිවන්* / *Madhuca longifolia* ), සියඹලා ගස් (*සිනිම්බලාන්* / *Tamarindus indica* ) ආදී ඵල දරන වෘක්ෂ සහ බෞද්ධයන්ගේ පූජනීය වෘක්ෂ වශයෙන් සළකනු ලබන දිඹුල් ගස් (*ඇසතු* / *Ficus religiosa*) ප්‍රධාන වේ. සාමාන්‍ය පොදු ජනතාව පමණක් නොව රාජකීයන් සහ රාජ්‍ය නිළධාරීන් ද මෙම නීතීන්ට ගරු කොට තිබේ. කැපීම තහනම් කරන ලද සහ විශේෂිත ඵල දරන වෘක්ෂ සහ පූජනීය වෘක්ෂයන්ට අවධානයක් සහ සැලකිල්ලක් දක්වා ඇති බව ඒ අනුව පැහැදිලි වේ. මෙම ප්‍රතිපත්තිය බොහෝ දුරට වර්තමාන ලෝකයේ නූතන 'ගස' ආරක්ෂණය කිරීමේ ප්‍රතිපත්තියට සමාන වේ. මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙස තෝරාගත් ශිලා ලේඛනයන්හි දක්වෙන ආරක්ෂණ ක්‍රමවේදයන් සාහිත්‍යමය මූලාශ්‍රයන් සහ වර්තමාන ලෝක සම්මත පරිසර නීති රෙගුලාසි සමග සංසන්දනය කිරීමයි.

**ප්‍රමුඛ පද :** අත්තාණි කණු, වෘක්ෂ ආරක්ෂණය, අනුරාධපුර යුගය

* පුරාවිද්‍යා අධ්‍යන අංශය , කැලණිය විශ්වවිද්‍යාලය ,කැලණිය ptmperis@gmail.com